පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය **08**

# අවසාන වාර පරීක්ෂණය - 2019

විෂයය **බුද්ධ ධර්මය**

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ඇතුළත්වීමේ අංකය : ..................................................

..................................................

කාලය : පැය **02** යි.

# I පත්‍රය

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බුදුරජාණන් වහන්සේ සුදු රෙදිකඩක් දී "රජෝ හරණං රජෝ හරණං" යනුවෙන් සිහිකරමින් එම රෙදිකඩ පිරිමදින ලෙස පැවසුවේ,
(1) රාහුල හිමියන්ට ය. (2) පුණ්ණ හිමියන්ට ය.
(3) චුල්ලපන්ථක හිමියන්ට ය. (4) සැරියුත් හිමියන්ට ය.

02. තමාගේ වෙනත් කටයුතු සියල්ල පසෙකින් තබා සිතට නගා ගැනීමට සුදුසු බැවින් ධර්මය,
(1) ඕපනයික නම් වන සේක. (2) ඒහිපස්සික නම් වන සේක.
(3) අකාලික නම් වන සේක. (4) සන්දිට්ඨික නම් වන සේක.

03. බුදුරජාණන් වහන්සේ රජගහ නුවර සූකරඛත ලෙනෙහි දී "දීඝනඛ" පිරිවැජියාට දේශනා කළේ,
(1) ආදිත්ත පරියාය සූත්‍රය යි. (2) වේළුද්වාර සූත්‍රය යි.
(3) දම්සක් පැවතුම් සූත්‍රය යි. (4) වේදනා පරිග්ගහ සූත්‍රය යි.

04. "යම් කෙනෙක් මුල දී පමා වූවත් පසුව නුවණින් විමසා කටයුතු කළ යුතු ය," යන අදහස දැක්වෙන ධම්ම පද ගාථා පාඨය වනුයේ,
(1) යස්ස පාපං කතං කම්මං .... යන්න යි.
(2) යෝ ච පුබ්බේ පමජ්ජිත්වා .... යන්න යි.
(3) තතං කම්මං කතං සාධු .... යන්න යි.
(4) සුප්පබුද්ධං පබුජ්ඣන්ති .... යන්න යි.

05. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි ස්වාමියා විසින් භාර්යාවට ඉටුකළ යුතු යුතුකමක් වන්නේ,
(1) ගෙදරදොර වැඩ කටයුතු සංවිධානය කිරීම යි. (2) අවමන් නොකිරීම යි.
(3) උපයාගත් ධනය ආරක්ෂා කිරීම යි. (4) දක්ෂව, අනලස්ව සියලු කටයුතු කිරීම යි.

06. සතර බ්‍රහ්ම විහරණ යනු,
(1) දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව සහ සමානාත්මතාව යි.
(2) චීවර, පිණ්ඩපාත, සේනාසන සහ ගිලානපච්චය යි.
(3) මෙත්තා, කරුණා, මුදිතා සහ උපෙක්ඛාව යි.
(4) ඡන්දය, ද්වේෂය, භය සහ මෝහය යි.

07. දළදා වහන්සේ සිරිලකට වැඩමවීම පිළිබඳ සම්පූර්ණ පුරාවෘතය ඇතුළත් පැරණිම ග්‍රන්ථය වන්නේ,
(1) පාලි දාඨා වංශය යි. (2) දළදා සිරිත යි.
(3) මහාවංශය යි. (4) දළදා පූජාවලිය යි.

08. නිවැරදිව ධනය උපයා ආයෝජනය හා පරිභෝජනය කර විශාල ධනවතකු බවට පත් වූ පුද්ගලයකු පිළිබඳ දැක්වෙන ජාතක කතාව වන්නේ,
(1) අපණ්ණක ජාතකය යි. (2) ස්වර්ණ හංස ජාතකය යි.
(3) චුල්ලසෙට්ඨි ජාතකය යි. (4) වණ්ණුපථ ජාතකය යි.

09. "ඇම පමණින් පැවසූ මුනි දැන තතු" යන කාව්‍යය අඩංගු ග්‍රන්ථය,
(1) බුදුගුණ අලංකාරය යි. (2) ලෝවැඩ සඟරාව යි.
(3) කාව්‍යශේඛරය යි. (4) සිරිත් මල්දම යි.

10. ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන්,
(1) සත් මසකට පසුව ය. (2) සිව් මසකට පසුව ය.
(3) දෙ මසකට පසුව ය. (4) තෙ මසකට පසුව ය.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රකාශවල හිස්තැනට අදාළ නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

  **( අරියවංශ, කෝලිත, ධම්මචක්කප්පවත්තන, ක්‍රි.පූ. තුන්වන, අෂ්ට ගරු ධර්ම)**

11. බුදුරජාණන් වහන්සේ කාන්තාවන්ට පැවිදි බව ලබාදීමේ දී අනුමත කළේ ..............................ය.
12. මොග්ගල්ලාන බැමිණියගේ පුත්‍රයාගේ නම වනුයේ .................................ය.
13. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කළේ ................................ සියවසේ දී ය.
14. බුදුරජාණන් වහන්සේ පස්වග මහණුන්ට චතුරාර්ය සත්‍යය පිළිබඳ දේශනා කළේ ............................. සූත්‍රයෙනි.
15. .......................... ධර්ම දේශනාව පැරණි බෞද්ධයින් සිදුකළ ආගමික චාරිත්‍රයක් වේ.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

16. ලද දෙයින් සතුටු වීම උතුම් මංගල කරුණකි. ( )
17. දළදා වහන්සේ උදෙසා දිනකට දෙවරක් පුද පූජා පැවැත් වේ. ( )
18. මළගෙදරකට පැමිණෙන සියලු දෙනා සුදු ඇඳුමින් සැරසී පැමිණීම බෞද්ධ සිරිතකි. ( )
19. බුදුරජාණන් වහන්සේ "අත්ථි සුඛය" පිළිබඳ කොසොල් රජතුමාට විස්තර කොට ඇත. ( )
20. බුදුරජාණන් වහන්සේ නන්ද හිමියන්ට දිව්‍යාංගනාවන් ලබා ගැනීමට අවශ්‍ය නම් භාවනා කළ යුතු බව පැවසූ සේක. ( )

(ලකුණු 2×20=40)

# II පත්‍රය

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

01. ඔබ පාසලේ වෙසක් පොහොය නිමිත්තෙන් භික්ෂූන් වහන්සේලා උදෙසා දානමය පිංකමක් සංවිධානය කරන ලදැයි සිතා, එහි දී පාසල් සිසුන් වන ඔබ ලද අත්දැකීම් ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
    i. දානමය පිංකම පැවැත්වීමට පෙර ඔබ විසින් සිදු කළ කාර්යයන් **දෙකක්** ලියන්න.
    ii. දානමය පිංකමට ඔබ රැගෙන එන ලද පූජා ද්‍රව්‍ය **හතරක්** ලියන්න.
    iii. එහි දී ඔබට පැවරුණු කාර්යයන් **දෙකක්** ලියන්න.
    iv. මෙම පිංකම සිදු කිරීමේ දී ඔබට ඇති වූ අභියෝග **දෙකක්** ලියන්න.
    v. දානමය පිංකම් කටයුතු සිදු කිරීමෙන් ඔබට ලැබෙන ආනිසංස **දෙකක්** ලියන්න.

(ලකුණු 4x5=20)

02.
    i. බුදුරජාණන් වහන්සේ විසින් සිගාලෝවාද සූත්‍රය දේශනා කළේ කා හට ද? (ලකුණු 02)
    ii. එම සූත්‍රයේ සඳහන් පරිදි කළණ මිතුරෙකු තුළ තිබිය යුතු යුතුකම් පහෙන් තුනක් ලියන්න. (ලකුණු 03)
    iii. කළණ මිතුරන් ඇසුරු කිරීමෙන් ශිෂ්‍ය ජීවිතය යහපත් වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

03.
    i. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ මහා මංගල සූත්‍රයේ අඩංගු මංගල කාරණා ගණන කීය ද ?. (ලකුණු 02)
    ii. බුද්ධ කාලයේ දී මංගල කරුණු සම්බන්ධයෙන් මිනිසුන් හා දෙවියන් අතර ඇතිවූ මතවාද තුන නම් කරන්න. (ලකුණු 03)
    iii. සමාජයේ යහපත සඳහා මහා මංගල සූත්‍රය යොදා ගන්නේ කෙසේදැ යි මංගල කාරණා පහක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

04\.

i. ලෝක පාලක ධර්ම නම් කරන්න. (ලකුණු 02)

ii. කයින් සිදුවන අකුසල කර්ම තුන ලියන්න. (ලකුණු 03)

iii. බුදුරජාණන් වහන්සේ වදාළ සේඛියා ශික්ෂා පද ඇසුරින් ආහාර පාන ගැනීමේ දී අනුගමනය කළ යුතු යහපත් සිරිත් විරිත් පහක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

05\.

i. ගිහියාගේ නිත්‍ය ශීලය වන්නේ කුමක් ද?. (ලකුණු 02)

ii. ඉන් ශික්ෂා පද තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. මත්ද්‍රව්‍ය භාවිතා නොකිරීමෙන් ඇතිවන යහපත් ප්‍රතිඵල විස්තර කරන්න. (ලකුණු 05)

06\.

i. "අත්තූපනායික ධර්මය" යනු කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

ii. කටයුතු කරන ආකාරය අනුව ලෝකයේ පුද්ගලයෝ සතර ආකාර වෙති. ඉන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

iii. බොදු දරුවෙකු ලෙස අන් අයගේ සුභසිද්ධිය වෙනුවෙන් ඔබට කළ හැකි කාර්යයන් මොනවාදැ යි පැහැදිලි කරන්න. (ලකුණු 05)

07\.

i. "කලන්දක නිවාප" නම් සොඳුරු වනයේ දී බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ සූත්‍රය කුමක් ද?. (ලකුණු 02)

ii. දිවා රෑ පින් වැඩෙන පින්කම් ලෙස, බුදුරජාණන් වහන්සේ වදාළ පින්කම් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. බුදුරජාණන් වහන්සේ විසින් ස්වාභාවික පරිසරය නිතර වර්ණනා කර ඇත. නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

* * *

**තෙවන වාර පරීක්ෂණය- 2019**

**8 ශ්‍රේණිය**

**1 පත්‍රය-පිළිතුරු**

1. චුල්ලපන්ථක හිමියන්ටය - 3
2. ඕපනයිකෝ නම් වන සේක - 1
3. වේදනා පරිග්ගහ සූත්‍රයයි - 4
4. යෝ ච පුබ්බේ පමජ්ජිත්වා............යන්නයි - 2
5. අවමන් නොකිරීම - 2
6. මෙත්තා, කරුණා, මුදිතා , උපේක්ඛාය - 3
7. පාලි දාඨාවංශය යි - 1
8. චුල්ලසෙට්ඨි ජාතකයයි - 3
9. ලෝවැඩ සඟරාවයි - 2
10. තෙමසකට පසුව යි - 4
11. අෂ්ටගරු ධර්ම
12. කෝලිත
13. ක්‍රි . පු තුන්වන
14. ධම්මචක්කප්පවත්තන සූත්‍රය
15. අරියවංශ
16. ✓
17. ×
18. ✓
19. ×
20. ✓

**තෙවන වාර පරීක්ෂණය -2019**

**බුද්ධ ධර්මය 8 ශ්‍රේණිය**

**11 පත්‍රය - පිළිතුරු**

(01)

i. දින නියම කර ගැනීම
 භික්ෂූන් වහන්සේලාට ආරාධනා කිරීම
 පාසල සුද්ද පවිත්‍ර කිරීම

- ආදි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

ii. පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න

iii. පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න

iv. පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න

v. පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න

(02)

i. සිගාල ගෘහපතියාට (70 පිටුව)

ii. 1- දානය
 2- ප්‍රිය වචනය
 3- අර්ථචර්යාව
 4- සමානාත්මතාව
 5- නො රැවටීම (74 පිටුව)

iii. පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න

(03)

i. 38 යි

ii. 1 - දිට්ඨ මංගල
 2 - සුත මංගල
 3 - මුත මංගල

iii. පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න

(04)

i. හිරි - ඔත්තප්ප (ලැජ්ජා - බය)

ii. 1- සතුන් මැරීම
 2- සොරකම් කිරීම
 3- කාමය වරදවා හැසිරීම

iii. පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න (56 පිටුව බලන්න)

(05)

i. පංචශීලයයි

ii. පන්සිල් වලින් තුනක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

iii. පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න

(06)

i. තමා උපමා කොට ගෙන අන් අයට හිංසා පීඩා කිරීමෙන් වැළකීම

ii. 1 - තම සැපත යහපත ගැන පමණක් සිතා කටයුතු කරන්නෝ,

2 - අනුන්ගේ සැපත යහපත ගැන පමණක් සිතා කටයුතු කරන්නෝ,

3 - දෙපක්ෂයේ ම සැපත යහපත ගැන සිතා කටයුතු කරන්නෝ,

4 - දෙපක්ෂයේ ම සැපත යහපත ගැන සිතා කටයුතු කරන්නෝ,

iii. පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න

(07)

i. මහා මොග්ගල්ලාන සූත්‍රය

ii. පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න (117 පිටුව)

iii. පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න